**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව - 2019**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **16(1)** උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාවක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) වර්ෂ 05 කින් නැවත ආපසු ලබා ගත හැකි වන පරිදි පෞද්ගලික ආයතනයක තැන්පත් කර තිබුණු රු.12,280,195 ක මුදලින් රු. 2,674,746 ක මුදලක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 1 ට පටහැනිව ජංගම වත්කම් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | කුලී ගිවිසුමට අනුව ගෙවා ඇති තැන්පතු මුදල් අනුව රු.9,607,449 ක තැන්පතුව වසරකට වඩා වැඩි කාලයකට පෙර ගෙවා ඇති අතර ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීම නිවැරදි වේ. රු. 2,674,946 ක තැන්පතුව 2019 වසරේදී ගෙවා ඇති අතර එය වසරකට වඩා අඩු කාලයක් බැවින් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම් ගත කරනු ලබයි. 2020 වසරෙදි ජංගම නොවන වත්කම් වලට අදාල වටිනාකම මාරු කරනු ලබේ. | ප්‍රමිතියේ අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීම. |
| (ii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ට අනුව වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව නැවත සමාලෝචනය කර ඒ අනුව අනාවරණය වන ඇස්තමේන්තුගත දෝෂ නැවත සංශෝධනය කළ යුතු වුවත් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරන ප්‍රමිතාංග 07 ට අනුව මෝටර් රථ වල ඵලදායී ජීවකාලය 2018 වසරේදී පරීක්ෂා කර ඇති අතර ප්‍රත්‍යාගණිත ලාභය 2018 වසරේදී නිවැරදිව ගිණුම් ගත කර ඇත. අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට විගණන කමිටුව මඟින් | ප්‍රමිතියේ අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| දැනට ප්‍රයෝජනයට ගන්නා එකතුව රු 36,147,267 ක් වූ වත්කම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | අනුමැතිය ලබාදී නැති අතර මෝටර් රථ වල පමණක් වසර 3කට වරක් ප්‍රත්‍යාගණනය කිරීමට විගණන කමිටුව මඟින් අනුමැතිය ලබාදී ඇත. | |
| (iii) 2019 වර්ෂයේ මිලදී ගන්නා ලද රු.4,723,000 ක් වටිනා පරිසනක මෘදුකාංගයක් ආයතනයේ අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කිරීමටත් එම වත්කම ක්‍රමක්ෂය කිරීමටත් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 20 ට අනුව කටයුතු කර නොතිබුණු අතර මෙම මෘදුකාංගය සඳහා 2019 වර්ෂයෙහි දරන ලද රු.844,167 ක ගෙවීමක් කලින් ගෙවීම් යටතේ දක්වා තිබුණි. තවද මෙම මෘදුකාංගය සම්බන්ධයෙන් අදාල සැපයුම්කරු සමග ඇති කර ගන්නා ලද ලිඛිත ගිවිසුමක් ද විගණනයට ඉදිරිපත් නොවුණි. | මෙම මෘදුකාංගය සඳහා ගෙවා ඇති රු.844,167 ක් පෙර ගෙවුම් ලෙස සඳහන් කර මාසිකව ආදායම් හා වියදම් ගිණුමට හර කරනු ලබන අතර මෙය වාර්ෂිකව ගෙවන බලපත්‍ර ගාස්තුවක් බැවින් රු.4,723,000 ක් වන්නේ අවුරුදු 05 කට ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුවයි. මෙය වාර්ෂිකව ගෙවීම් කරන නිසාත් වර්ෂයකට වැඩි කාලයකට ප්‍රතිලාභය නොලැබෙන නිසාත් මෙය අස්පෘශ්‍ය වත්කමක් ලෙස ගිණුම්ගත කළ නොහැකි වේ. එම නිසා මෙය ආදායම් හා වියදම් ගිණුමට හර කරනු ලබයි. | ප්‍රමිතියේ අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීම. |

### 1.5.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි(2) 6 (ඇ) වගන්තිය | කොමිෂන් සභාව විසින් එහි බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටුකිරීමේ දී, කොමිෂන් සභාවට ලැබෙන සියලු මුදල් එහි ආදායම් ලෙස හඳුනාගත යුතු වුවද 2019 වර්ෂයේදී සෙස් බදු ලෙස ලැබී තිබුණු රු.493,068,161 ක් සහ 2019 වර්ෂයෙහි රක්ෂණ භාර දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලට අදාල රු. 574,313,018 ක් වූ පොළී ආදායම කොමිෂන් සභාවෙහි සමාලෝචිත වර්ෂයෙහි ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණු අතර පසුගිය වර්ෂයේ දී ද මෙම තත්ත්වය එලෙසම පැවති බව නිරීක්ෂණය විය. | 2019 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුල සටහන් අංක 7ට අනුව සියලු ආදායම් වෙන වෙනම PPF හි සටහන් කොට ඇත. කොමිෂන් සභාවේ ආදායම්, ආදායම් ප්‍රකාශය තුල නිවැරදිව නිරූපනය කර රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලට ලැබෙන ආදායම් වෙන වෙනම රක්ෂණ ඔප්පුහිමියන්ගේ අරමුදලේ ආදායම් ලෙස සටහන් කර ඇත. | ආදායම් නිවැරදිව හඳුනාගෙන නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii) 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 48(1) වගන්තිය** | සෑම රක්ෂණකරුවෙකු විසින්ම, ඒ ව්‍යාපාරයේ රක්ෂණකරුගේ වත්කම් හා බැරකම් තක්සේරු කිරීමක්ද ඇතුළුව, එක් එක් මුදල් වර්ෂය අවසානයේදී ජීවගණකයෙකු ලවා විමර්ශනයක් කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් සාදන ලද රීති වලට අනුකූලව උද්ධෘතයක් පිළියෙල කිරීමටද මණ්ඩලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතුය. එසේ වුවද, කොමිෂන් සභාවේ ජීවගණක තනතුර දිගින් දිගටම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් රක්ෂණකරුවන් විසින් වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන ජීවගණක වාර්තා සමාලෝචනය කිරීම සඳහා ස්ථිර වැඩපිළිවෙලක් යෙදීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි. | ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක මූල්‍ය ක්ෂේත්‍රය නවීකරණ ව්‍යාපෘතිය **(Finance Sector Modernization Project)** මඟින් මේ වන විට ජීවගණක උපදේශකවරයෙකු පත් කර මේ වන විට ඔහු මඟින් මෙම කටයුතු කරගෙන යනු ලබයි. | ජීව ගණක වාර්තා සමාලෝචනය කිරීම් කඩිනමින් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| **(iii) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14ඡේදය** | පරිපාලන අත්පොතක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර එකඟතාවය ලබා ගත යුතු වුවද **2020** ජුලි **31** දින වන විටත් කොමිෂන් සභාව භාවිතා කරනු ලබන අත්පොත සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය ලැබී නොතිබුණි. එසේවුවද, අත්තිකාරම් ගෙවීම්, වාහන ණය ලබාදීම් ඇතුළු කටයුතු අනුමැතිය නොලත් පරිපාලන අත්පොත ප්‍රකාරවම සිදුකෙරෙමින් පවතින බව නිරීක්ෂණය විය. | පාලන අත්පොත භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා **2017.03.30** දින ඉදිරිපත් කර ඇත. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් අංක **PE/REG/IRCSL/PR** හා **2018.04.05** දින දරණ ලිපිය මඟින් අප වෙත දැනුම් දී ඇත්තේ පරිපාලන අත්පොත් ඇගයීම සඳහා පවතින ක්‍රමවේදයේ ගැටළු හේතුවෙන් අනුමැතිය ලබා දීමේ ප්‍රමාදයක් ඇති බවයි. එමෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සිය ආයතන කටයුතු වලදී රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ ඇති විධිවිධානයන් අනුව කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව පරිපාලන අත්පොත අනුගමනය කරනු ලැබේ. | අදාළ චක්‍රලේඛ විධිවිධාන පරිදි ලබා ගත යුතු එකඟතාවයන් පරිපාලන අත්පොතට ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | **2017** අංක **24** දරණ දේශීය ආදායම් පනතේ **07**වගන්තිය | කොමිෂන් සභාවේ තක්සේරු වර්ෂයට අදාල ආදායම් බද්දට යටත් වියයුතු එකතුව රු. **1,067,381,178** ක් වූ සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් බදු, බැරකම් ගණනයේදී සලකා බලා නොමැති බව නිරීක්ෂණය විය. | **2017** අංක **24** ආදායම් බදු පනතට අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අතිරික්තය සඳහා ආදායම් බදු වටිනාකම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා ඇත.රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලට ලැබෙන **(PPF)** සෙස් හා පොලී ආදායම සඳහා අදාල බදු නිදහස් කර ගැනීමට අදාල ඉල්ලීම් මුදල් අමාත්‍යාංශය වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර ඒ සම්බන්ධව සාකච්ඡා කිහිපයක් පවත්වා ඇති අතර ඒ සම්බන්ධ තීරණයක් අපේක්ෂාවෙන් සිටිමු. ඒ වෙනුවෙන් රක්ෂණ නියාමන කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශය වෙත යවා ඇති ලිපි වල පිටපත් විගණනය වෙත අප විසින් ලබා දී ඇත. | **2017** අංක **24** දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ආදායම් බදු ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. **129,218,719** ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.**41,337,937** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. **87,880,782** ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායමේ ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් ප්‍රවණතා විශ්ලේෂණය

-----------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ආදායම සියයට **82** ක වැඩිවීමක් පෙන්නුම් කල අතර කාර්යමණ්ඩල පිරිවැය හා මූල්‍ය හා වෙනත් වියදම් පිළිවෙලින් සියයට **42** කින් හා සියයට **909** කින් වර්ධනයක් වී තිබුණි. එසේ වුවද ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී බදු පෙර අතිරික්තයේ රු. **108,021,452** ක වර්ධනයක් පෙන්නුම් කෙරුණු අතර එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට **250** ක වැඩිවීමක් විය.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි 13 (1) (ඇ) වගන්තිය පරිදි අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන ලබන රක්ෂණ සමාගම් විසින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන මුදලක් මහා භාණ්ඩාගාරයෙහි තැන්පත් කළ යුතුය. එලෙස තැන්පත්කරන ලද මුදල් පිළිබඳව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන උපලේඛණය හා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන උපලේඛනය අතර රු.3,700,000 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව අදාල වෙනසට හේතු සැසඳීමක් කර තැන්පතු ලේඛණ යාවත්කාලිනවපවත්වාගෙනගොස් නොමැති බව නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර තැන්පතු දෙපාර්තමේන්තුවේ මීට අදාළ තැන්පතු වාර්තාවේ මුදල් ගෙවූ අය පිළිබඳ නම් හෝ වෙනත් විස්තර සඳහන් නොවේ. එබැවින් මෙම තැන්පතු මේ සඳහා ලැබුණු තැන්පතු දැයි තහවුරු කල නොහැක. නමුත් කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවේ නම් ඇතුළු සියලු විස්තර ඇතුළත්ව ඇති නිසා අප විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාව නිවැරදි බව අපගේ විශ්වාසයයි. | අදාළ තොරතුරු යාවත්කාලින කර පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ii) 2007 වර්ෂයට පෙර ලියාපදිංචි කරන ලද රක්ෂණ ආයතන 11 ක් සම්බන්ධයෙන් ඉහත (අ) ඡේදයෙහි සඳහන් තැන්පතු පිළිබඳව තොරතුරු කොමිෂන් සභාව පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | යාවත්කාලින කිරීමට බලාපොරොත්තු වන බව දන්වා ඇත. | අදාළ තොරතුරු විධිමත්ව හා පූර්ණ වශයෙන් පවත්වා ගත යතුය |
| (iii) 2016 වර්ෂයට පෙර සිට ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු. 1,208,602 ක රදවාගත් බදු ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | 2016 වසරට පෙර වර්ෂ වල රු. 1,208,602 ක හිලව් නොවූ බදු බරක් පැවතීමට හේතුව රක්ෂණ නියාමන කොමිෂන් සභාව එම කාලය තුළ ආදායම් බදු ගෙවීමේ වගකීමක් නොතිබූ බැවිනි. 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතට අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ආදායම් බදු වලින් නිදහස් කොට තිබුණි. එම පනත 2017 අංක 24 දරණ නව | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | පණත අනුව ආදායම් බදු ගෙවිය යුතු අතර 2016 පෙර වර්ෂ වල රදවා ගැනීමේ බදු හිලව් කිරීමට හැකියාවක් නැත. | |

**3.2** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව 2016 වර්ෂයේ ආරම්භයේ සිට රක්ෂණ සමාගම්වල නුබුන්වත් නීති රාමුව වෙනුවට හඳුන්වාදුන් අවධානම් පාදක ප්‍රාග්ධනය මූලික කරගත් සුපරීක්ෂණ ක්‍රමයකට (RBC) යොමුවීම නිසා ජීවගණක ඒකකයක් ඇති කිරීමට 2016 වර්ෂයේදී අනුමත කළ විධායක මට්ටමේ තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුණි. | විධායක තනතුරු දෙක සඳහා බඳවා ගැනීම් සිදුකර ඇති අතර පුරප්පාඩුව පවතින ජීව ගණක සහ සහකාර ජීව ගණක තනතුරු සඳහා පුවත්පත් දැන්වීම් පලකර, බඳවා ගැනීමට කටයුතු සිදුකරමින් පවතී | කොමිෂන් සභාවේ කාර්යසාධනයට බලපෑමක් විය හැකි කාර්ය මණ්ඩල පුරප්පාඩු කඩිනමින් පිරවිය යුතුවේ. |